# කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය- ධීවර ක්ෂේත්‍රය - 2015

## 15 වන කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණයේ ( 15TH EPS-TOPIK ) විභාග මධ්‍යස්ථාන ,දිනය හා වේලාව නිවේදනය කිරීම.

1. **භාෂා ප්‍රවීණතා පරීක්ෂණය පැවැත්වෙන දිනය - 2015 නොවැම්බර් 22 ( ඉරිදා)**

2. **භාෂා ප්‍රවීණතා පරීක්ෂණය පැවැත්වෙන වේලාව -**

- පළමු සැසිය - 10:00 – 11:10

  (කියවීම 10:00 – 10:40 / අසා ලිවීම පෙ.ව.10:40 – 11:10)

- දෙවන සැසිය - 14:00 – 15:10

  (කියවීම 14:00 – 14:40 / අසා ලිවීම පෙ.ව.14:40 – 15:10)

➢ මෙම පරීක්ෂණයට අදාළව සියළුම උපදෙස් ලබාගැනීම සඳහා එක් එක් අයදුම්කරුවන් විසින් **පළමු සැසියේදී පෙ.ව.9.00 වනවිටත් දෙවන සැසියේදී ප.ව.1.00 වන විටත් තමාට නියමිත පරීක්ෂණ කාමරයේ අසුන් ගෙන සිටිය යුතු අතර,නියමිත වේලාව පසුවී පැමිණෙන** අයදුම්කරුවන්හට පරීක්ෂණ කාමරයට ඇතුළු වීමට ඉඩදෙනු නොලැබේ.

➢ **විභාග පංති කාමර දැනුම්දීම.**

- භාෂා ප්‍රවීණතා පරීක්ෂණය පැවැත්වෙන දිනයේදී එක් එක් අයදුම්කරුවන්ට පෙනී සිටීමට නියමිත පන්ති කාමරය පරීක්ෂණ දිනයේදී මධ්‍යස්ථානවල දැන්වීම් පුවරුවල ප්‍රදර්ශණය කරනු ඇත.

3. **අයදුම්කරුවන් සඳහා උපදෙස් -**

- භාෂා ප්‍රවීණතා පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය,දිනය හා වේලාව නිවැරදිව තහවුරු කරගන්න.(අයදුම්කරුවන් සඳහා වෙන්කර ඇති විභාග මධ්‍යස්ථානයේදී නියමිත දින හා අදාළ සැසිය අනුව පමණක් පරීක්ෂණය සඳහා පෙනිසිටිය හැකිය.)

- පරීක්ෂණ දිනයේදී සෑම අයදුම්කරුවෙකුට ප්‍රශ්නපත්‍ර කට්ටලයක් සහ පිළිතුරු සැපයිය යුතු පත්‍රිකාවක් ලබාදෙනු අතර, විභාග අයදුම්කරු වෙත ලැබෙන පිළිතුරු පත්‍ර කට්ටලයේ මුද්‍රණය කර ඇති අයදුම්කරුගේ නම සහ විභාග අංකය තමාගේ බවට ස්ථිර කරගත යුතුය. තවද අයදුම්කරු වෙත ලැබෙන විභාග ප්‍රශ්න පත්‍ර කාණ්ඩයට සමාන කාණ්ඩයේ පිළිතුරු සටහන් පත්‍රිකාවක් ලබාගත යුතුය.( උදා -A,B,C සහ D)

- ප්‍රශ්න පත්‍ර වර්ගයේ වෙනස් වීම නිසා ඇතිවන ගැටළු සම්බන්ධ වගකීම අයදුම්කරු සතුවේ.එබැවින් විභාගය ආරම්භ වීමට පෙර තමාට ලැබී ඇති ප්‍රශ්න පත්‍ර වර්ගය හා පිළිතුරු සටහන් පත්‍රය සමාන දැයි පරීක්ෂා කළ යුතුවේ.